# රත්තොට ප්‍රාදේශීය සභාව

## *සැපයුම්කරුවන් ලියාපදිංචිය - 2026 වර්ෂය සඳහා*

රත්තොට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට භාණ්ඩ (G), සේවා (S), වැඩ (W) සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ. මේ සඳහා අප විසින් සපයනු ලබන ආකෘතිය භාවිතා කළ යුතු අතර සෑම සුදුසුකම්ලත් සැපයුම්කරුවකුම ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකයේ සහතික කල පිටපතක් හා පෙර වර්ෂ 3ක් තුළ භාණ්ඩ හෝ සේවා සැපයීම් පළපුරුද්ද පිළිබඳව සහතික සහිත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන සෑම අයදුම්පත්‍රයක් සමග ලියාපදිංචි ගාස්තු වශයෙන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා රු.1000.00ක මුදලක් ද වැඩ සඳහා රු.3000.00 ක මුදලක් ද මුදලින් හෝ චෙක්පත් මගින් ගෙවිය හැකි අතර එම මුදල කාර්යාල දින වල දී පමණක් පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා කාලය තුල රත්තොට ප්‍රාදේශීය සභා සරප් වෙත ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුය.චෙක්පත් යොමු කිරීමේදී "*ලේකම්, ප්‍රාදේශීය සභාව - රත්තොට*" නමින් ඉදිරිපත් කළ යුතු වේ.(චෙක්පත නිෂ්කාශනයෙන් පසු ලියාපදිංචිය සඳහා ඇතුලත් කෙරේ.)පහත සඳහන් එක් එක් අයිතම වර්ග සඳහා වෙන් වෙන් වශයෙන් ගාස්තු ගෙවීම් සිදු කළ යුතුය.මිල ගණන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් කැඳවන අතර ආයතනික අවශ්‍යතාව අනුව වෙනත් සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවා භාණ්ඩ,සේවා හා වැඩ ඉටුකර ගැනීමේ අයිතිය රත්තොට ප්‍රාදේශීය සභාව සතු වේ.ලියාපදිංචිය සඳහා වන ඕනෑම අයදුම්පතක් පිළි ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආයතනය සතු වේ.අයදුම්පත් රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් හෝ අපගේ නිල වෙබ් පිටුවට පිවිස බාගත කළ හැකිය.සියල්ල සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ "**<u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2026</u>**" සඳහන් කර නියමිත දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය සභා ගිණුම් අංශයට අතින් ගෙනවිත් බාර දෙන්න.ලියාපදිංචි කිරීමේ අවසන් දිනය 2026.01.27 දින ප.ව 2.00 වේ.

**G 01 -** කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය,පරිගණක ආශ්‍රිත ලිපි ද්‍රව්‍ය හා පාසල් උපකරණ
**G 02 -** පරිගණක මුද්‍රණ ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය (ටෝනර්/රිබන් යනාදිය)
**G 03 -** පුස්ථකාල පොත් හා ග්‍රන්ථ සැපයීම
**G 04 -** කාර්යාලයීය උපකරණ (මේස,පුටු,කැබිනට්,රාක්ක ආදිය)
**G 05 -** රෙදි පිළි (නිල ඇඳුම්,මේස රෙදි,තිර රෙදි යනාදිය)
**G 06 -** පරිගණක,ඡායා පිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර ඇතුළු කාර්යාලයීය උපකරණ
**G 07 -** වේලාව සටහන් කිරීමේ උපකරණ සැපයීම
**G 08 -** කැමරා ප්‍රොජෙක්ටර් හා වීඩියෝ උපකරණ සැපයීම හා ජෙනරේටර්,හට්,පුටු,මේස සැපයීම
**G 09 -** විදුලි උපකරණ (වීදි ලාම්පු හා වෙනත් විදුලි උපාංග)
**G 10 -** මෝටර් රථ අමතර කොටස්
**G 11 -** ටයර්,ටියුබ් හා බැටරි
**G 12 -** දැව/ප්ලාස්ටික් නාම පුවරු සැකසීම හා දින මුද්‍රා
**G 13 -** සනීපාරක්ෂක ද්‍රව්‍ය හා ප්ලාස්ටික් බඩු (ඉදල්,කොසු ආදි පාරිභෝගික ද්‍රව්‍ය
**G 14 -** ක්‍රීඩා භාණ්ඩ හා පදක්කම් කුසලාන
**G 15 -** ජල නල ආශ්‍රිත උපාංග හා උපකරණ
**G 16 -** ගොඩනැඟිලි නඩත්තු ද්‍රව්‍ය, සිමෙන්ති හා තීන්ත වර්ග
**G 17 -** වීදුරු හා ග්ලාස් පැඩ් සැපයීම
**G 18 -** බැනර්,කොඩි,පෝස්ටර් හා ස්ටිකර් මුද්‍රණය හා අනෙකුත් සියළු මුද්‍රණ
**G 19 -** වෛද්‍ය උපකරණ සැපයීම
**G 20 -** පෙර පාසල් උපකරණ හා සෙල්ලම් මිදුලට අවශ්‍ය සෙල්ලම් උපකරණ/බඩු
**G 21 -** යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (විදුලි ජනක යන්ත්‍ර,පවර් ටූල්ස් හා වෙනත් යන්ත්‍ර)
**G 22 -** පානීය ජල බෝතල් සැපයීම
**G 23 -** නිල හැඳුනුම්පත් සකස් කිරීම
**G 24 -** ගිනි නිවන උපකරණ සැපයීම හා නඩත්තුව
**G 25 – CCTV** කැමරා සැපයීම හා නඩත්තුව
**S 01 -** වාහන අළුත්වැඩියාව
**S 02 -** වාහන සේවා සිදු කිරීම
**S 03 -** වාහන කුෂන්,ටෙන්ට් හා කැනපි සවි කිරීම
**S 04 -** විදුලි උපකරණ අළුත්වැඩියාව
**S 05 -** පරිගණක,මුද්‍රණ යන්ත්‍ර,ඡායා පිටපත්,ෆැක්ස් ආදී යන්ත්‍ර සේවා කටයුතු හා පරිගණක ජාලගත කිරීම
**S 06 -** ආහාරපාන වර්ග සැපයීම
**S 07 -** විදුලි ජනක යන්ත්‍ර සේවා හා ජල මෝටර් අළුත්වැඩියා කටයුතු
**S 08 -** අපවහන/ගලී සේවා
**W 01 -** මුද්‍රණ කටයුතු (පොත් බැඳීම ඇතුළුව)
**W 02 -** ගොඩනැඟිලි ඉදි කිරීම් අළුත්වැඩියාව හා වයරින් කිරීම (ඉක්ටෑඩ් ලියාපදිංචි සීමාව **C-9** අවමය)
**W 03 -** මාර්ග ඉදි කිරීම් අළුත්වැඩියාව හා වාරි මාර්ග කටයුතු (ඉක්ටෑඩ් ලියාපදිංචි සීමාව **C-9** අවමය)
**W 04 -** ගොඩනැඟිලි ඇතුළත තිරි රෙදි යෙදීම
**W 05 -** ඇලුමිනියම් පාටිෂන් කිරීම
**W 06 -** පස් කැපීම හා ප්‍රවාහනය සඳහා යන්ත්‍රෝපකරණ සැපයීම
**W 07 – Intercom** නඩත්තු සේවා හා අභ්‍යන්තර ජාල පද්ධති **(Server Room)** යෙදීම
**W 08 -** අවදානම් ගස් කැපීම


**විමසීම්**

ලේකම් - 074 3110212
ප්‍රසම්පාදන - 076 3901413
දුරකථන අංකය - 066 2255275

සභාපති/ලේකම්
ප්‍රසම්පාදන කමිටුව
ප්‍රාදේශීය සභාව රත්තොට

ඊ මේල් - pradeshiyasabharattota@gmail.com
වෙබ් පිටුව - https://rattota.ps.gov.lk/downloads/